**7 වන පිටෙන්**

කිසිවකු කතා නොකරන තරමට බටහිර ජාතීන් අවනත කර ගැනීමට ඉස්රායලය සමත්වීම නිසා ය.

ඇප්ගනිස්තානයට කඩා වැදුණු සෝවියට් හමුදාව පලවා හැරීමේ සටනට අතකොලුවක් ලෙසට යොදා ගනු ලැබූ ඇල් කයිඩා සංවිධානය සහ බින් ලාඩින් ඇමරිකාවේ සතුරන් බවට පත්වීමට මූලික සාධකය වූයේ ඉස්රායලය විසින් පලස්තීන ජනතාවට කරනු ලබන වධ හිංසාවන්ට අනුබල දීමට ඇමරිකාව ඉදිරිපත්වීම ය. අද පවා ඉස්රායලය සතු න්‍යෂ්ඨික අවි ගබඩාව (රහස් තැනක ඇති) ගැන කතා කිරීමට බටහිර බලවතුන් පමණක් නොව න්‍යෂ්ඨික බලය පාලනය කිරීමට පිහිටුවා ගත් ජාත්‍යන්තර සංවිධාන පවා පසුබට වන්නේය.

ඇමරිකාව කළ තුන්වැනි පාප කර්මය කිරීමට ඉදිරිපත්වූයේ සංග්‍රාම ජනාධිපති යනුවෙන් තමාටම කියා ගත් ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉදිරියේ අතේ පැලවෙන බොරුවක් කීමට කොලින් පාවල් එවමින් පටන්ගත් ලෝක බොරුව කිරීමට එ ජා



සංවිදානයේ අනුමැතිය නොලැබුණ ද සිය මනාපයට ස්වෛරී රාජ්‍යයක් වූ ඉරාකය ආක්‍රමණය කිරීම බුෂ්ට ප්‍රශ්නයක් නොවී ය. (ඔහු අනුව යමින් බරක් ඔබාමා ස්වෛරී රාජ්‍යයක් වූ පකිස්ථානයට බලෙන් කඩා වැදී බින් ලාඩන් ඝාතනය කිරීමට භටයන් යෙදවූවේ ය. අද ඩොනල්ඩ් ට්‍රම්ප් ස්වෛරී රාජ්‍යයක් වූ සිරියාවට බෝම්බ හෙළන්නේද බුෂ්ගෙ අඩිපාරේ යමින් ය)

අයිසිස් නමින් අද ඉස්මතුව ඇති අන්තවාදී මුස්ලිම් සංවිධානයට මුල පිරීම ඉරාකය ආක්‍රමණය කිරීම බව කියන කෙනෙක් අද නැත. ලබ්බට තැබූ අත පුහුලටත් තැබීම අපේ ගම්වල ජනයාගේ පුරුද්දය. ඇමරිකානු ජනාධිපතිත් ඒ පුරුද්දට ඇබ්බැහි වූවේ ය. ඉරාකයෙන් නොනැවතුණ ඔහු තවත් ලෝක බොරුවක් මවා පා කොහේවත් නැති ඇල් කයිඩාවක් ඉරාකයේ සිටි බව කියමින් ඇගනිස්ථානයටත් කඩා වැදුණේ ය. ඔහු පිටුපස දිවීමට අර ඇදගෙන සිටි ජෝන් හොවාඩ් සහ ටෝනි බ්ලෙයාර් බඳු නායකයෝ ද ඒ සටනට සම්මාදම් වූවෝ ය. ඒ ආක්‍රමණය තුන්වැනි ඇමරිකානු පාපයේ දෙවැනි පියවර ය.

සිව්වැනි පාපය - ඊටත් වඩා දිග ය. සංකීර්ණ ය. අතිගරු ප්‍රජාතන්ත්‍රවාදය අපනයනය කිරීමේ පරම චේතනාව පෙරදැරි කරගත් බුෂ් ජනාධිපති එයින් නොනැවතී ලිබියාව සහ ඊජිප්තුව යන දෙරටේම නායකයන් පහ කිරීමේ පුණ්‍යකර්මය නිසි පරිදි ඉෂ්ට කිරීමට සමත් විය. ඉවර නැත. යේමනයේ අසරණ ජනතාව මත බෝම්බ හෙළමින් ඔවුන් මරා දැමීමේ කොන්ත්‍රාත්තුව බාර දීමට ඔහු සොයා ගත්තේ සිය පවුලේ හිතවතුන් වූ සවුදි ආරාබියාවේ රජු ය. ඔවුහුද ඒ යුතුකම නොපිරිහෙළා ඉටු කළෝ ය. අද උන්හිටි තැන් නැති වූ යේමන ජනතාවට පිහිට වන කෙනෙක් ඇද්දැයි නොදනිමි.

සිරියාව පාලනය කරන්නේ ද සවුදි අරාබිය පාලනය කරන ආකාරයේම ඒකාධිපති පාලකයෙකි. වෙනසකට ඇත්තේ සවුදිය ඇමරිකාවේ හිතවතා වීම පමණකි. හිතවතාගේ වැරදි වසා ගැනීමට මිතුරාගේ සත් ක්‍රියාවක් වන්නේ ය. සිරියාවේ අධිපති අසාද් බලයෙන් පහ කිරීමට සටන් වැදුණු කැරලිකරුවන්ට අවියෙන් හා වෙනත් අයුරින් ආධාර කිරීම වුව ද ස්වෛරී රාජ්‍යයකට එරෙහිව ක්‍රියා කිරීමකි. ව්ලැඩිමීර් පුටින් පෙන්වා දුන් පරිදි ජාත්‍යන්තර නීතියට - සම්මතයට- පටහැනි ක්‍රියාවකි. ඩොනල්ඩ් ට්‍රම්ප්ට බුෂ්ට වාගේම නීතියක් - සාධාරණයක් - නොපෙනන බව බලයට පත් ටික දිනකින්ම අවි අමෝරාගෙන මැද පෙරදිගට තරවටු කිරීමෙන්ම පෙනී යයි.

වසර හයකට වැඩි කලක් පුරා නොනැවතී දිගට ඇදී යන මේ අරගලය විසඳීමට පාලකයා බලයෙන් පහ කිරීම විසඳුම යයි කීමට ඇමරිකාවට ඇති අයිතිය කුමක්දැයි ඇසීමට ඔවුන්ට උඩ ගෙඩි දෙන මැල්කම් ටර්න්බුල් ට හෝ අනෙක් බටහිර බලවතකු සවියක් නැත. එසේත් නොවේ නම් ඒ සියලු දෙනාම අදහන ආකාරයට දෙවියෙක් හෝ උත්තරීතර බලවේගයක් තිබිය යුතුය. සිටිය යුතුය.

එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ධුරය දැරූ බන් කි මූන්ට කළ හැකිවූයේ වරින් වර ප්‍රකාශයක් නිකුත් කිරීම පමණකි. වත්මන් මහ ලේකම්ටත් ඊට වැඩි යමක් කළ නොහැකිය.

මුසාවෙන් සහ වංචාවෙන් ලොවක්ම රැවටීම උගහට බව දැන් වත් පෙනී යා යුතුය.

# සයිටම් අරගලය හා අවස්ථාවාදය



## බුද්ධදාස ගලප්පත්ති ගේ ෆේස්බුක් පිටුවෙන්



ඉතා පැහැදිලිව කිවහොත් වෛද්‍යවරුන් මේ ගෙන යන්නේ කුහක වූ බලලෝභී දේශපාලන අරමුණක් වෙනුවෙන් රටේ ජනතාව පීඩනයකට පත් කිරීමක් විනා වෙන කිසිවක් නොවේ.
සයිටම් දරුවා බිහි කරන්නට එවක මහින්ද රජය සහ අදාළ සයිටම් බලධාරීන් විළිරුදාවෙන් පෙළෙන අවස්ථාවේ පාදෙණියලා, සොයිසලා ප්‍රමුඛ දොස්තර සංගමය සිටියේ මුඛවාඩම් බැඳගෙනය.

සයිටම් දරුවා ප්‍රසූතියේදී සිදු කළ සිසේරියන් සැත්කම හෙවත් මහින්ද රජයේ ආධාර ප්‍රතිපාදන මිලියන ගණන් දෙද්දී වෛද්‍ය සංගමය සිටියේ අන්ධයන් සේය.
සයිටම් දරුවාට ඉඳුල් කට ගෑමේදී හෙවත් රජයේ ශිෂ්‍යත්ව ආදිය ලබා දෙද්දීද පාදෙණිය, සොයිසලා ප්‍රමුඛ වෛද්‍ය සංගමය බිහිරෝ වූහ.

සයිටම් දරුවා දණගාමින් වචන තතන තතනා අඩි තබමින් ඇවිදින්නට උත්සාහ කරද්දී හෙවත් සයිටම් ආයතනය රජය පිළිගනිද්දී උසස් අධ්‍යාපන ඇමැතිවරයා විසින් උපාධි ආයතනයක ලෙස පනත් ගත කෙරෙද්දී එය විශ්වවිද්‍යාලයක් ලෙස ව්‍යවස්ථාපිතව පිළිගනිද්දී පාදෙණිය - සොයිසා ප්‍රමුඛ වෛද්‍ය සභාව දෙකොන පූට්ටුවූවන් සේ සිටියෝය.
මේ අතර වාරයේ සයිටම් දරුවාගේ දුක සැප බලන්නට නාමල් බේබිලා නිරීක්ෂණ චාරිකා යද්දී වෛද්‍ය සභාව උඩු බිරුවේ නැත්තේමය.

මේ සියල්ල දෙස එදා කිසිදු හඬක් නොනගා තුෂ්ණිම්භූතව බලා සිටි වෛද්‍ය සභාව හදිසියේ නින්දෙන් අවදි වී මේ කරගෙන යන ජන පීඩිත අසමජ්ජාති විරෝධය කුමක්ද....? ඔවුහු එදා තම අභිමතය පරිදි සියල්ල තීරණ තීන්දු කළ මහින්ද රජයේ අත්තනෝමතිකයන් ඉදිරියේ නිවට නියාළුව වහල්ලු ලෙස සිට කුරිරු ලෙස රෝගීන් බිලි ගනිමින් ජරා දුකට පත් කරමින් මේ ගෙනියන ඊනියා විරෝධයේ අභිප්‍රාය වනුයේ පවතින රජය අපහසුතාවට, ජන විරෝධයට ලක්කර පෙරළා දැමීමේ බලලෝභී දේශපාලන අශීලාචාර වුවමනාවට බළල් අත් වීමය.

ඕනෑම ක්‍රියාවකට සමාන වූත් ප්‍රතිවිරුද්ධ වූත් ප්‍රතික්‍රියාවක් ඇතැයි මහා විද්‍යාඥ අයිසැක් නිව්ටන් පවසා ඇත. අමානුෂික ලෙස පීඩාවට පත්ව සිටින ජනතාව මේ ඊනියා වෛද්‍යවරුන්ට ප්‍රතික්‍රියා දැක්වීම මේ පීඩනය හමුවේ නුදුරේම අත ළඟම ඇත්තේය. එසේ වුවහොත් නම් ජන විරෝධය මේ වෛද්‍ය සභාවට කෙසේ බලපානු ඇතිදැයි සිතීම පවා උගහටය.

උගත්, බුද්ධිමත් යැයි කිවහැකි පිරිස් මේ ආකාරයේ අවර ගණයේ අමානුෂික මිනිසුන් බවට පත්වීම කුහක බලලෝභී දේශපාලනයේ නිරුවත හෙළි කරන්නෙකි.
සාධාරණ නොවූ ඉල්ලීම් රැසකට මුවා වී කරන්නා වූ මේ දේශපාලන සූදුවේ නිමාවක් ඉක්මනින් දැකිය යුත්තේමය. ඒ සඳහා සවිඥානික ජනතා එකමුතුවක පෙළ ගැස්මක් සිදු නොවේ යැයි සිතිය නොහැක්කේය.

උගත්කම ගැන උඩඟු වීම තරම් නූගත්කමත් නැතැයි ඒබ්‍රහම් ලින්කන් පවසා ඇත්තේය. වර්ජිත වෛද්‍යවරුන් මේ ජනතාවට කියා පාන්නේ තමන්ගේ උගත්කම පිළිබඳව කුහකත්වයේ නූගත්කමේ පාඩමය. ජනතාව මේ පාඩම නම් කියැවීමට කිසිසේත්ම සූදානම් නැත. තමන් කළ ජන විරෝධීය, සමාජ විරෝධී, නීති විරෝධී ක්‍රියාදාම සමූහයට නිසි පිළිතුරු දී ගෙදර යැවූ දේශපාලන බලවේග තම දූෂිත පිළිවෙත් හෙළි වෙතැයි භීතියෙන් ගෙන යන කුමන්ත්‍රණයන්ට වහලූන් වන්නේ තවත් එවැනිම නිහීනයන්ය.

ඒ නිසා මේ ඊනියා ජන පීඩිත වර්ජනයන්හි අභිමතය යළිත් බලාධිකාරී වීම නම් එය පරාජිතයන්ගේ විකෘති වූ සිහින දැක්මකි. කිලිටි සිතින් අකුසල් කරන්නා පසුපස දුක ලුහුබඳින බව මේ වෙසක් සමයේ කිලිටි සිතින් ජනතාව අපහසුතාවට පත් කරන්නවුන් පිරිසඳ දත යුතු සත්‍යයකි.

අවසන ඔවුන්ට ඉතිරි වන්නේ දුක පමණි. වෛද්‍යවරුන් මේ නිරත වන්නේ අසාධාරණ ක්‍රියාවක බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමිපාණෝ ප්‍රකාශ කළේ මෙහි අනිටු විපාක දක්වමිනි.වෛද්‍යවරුන් මේ කරන්නේ පවකි. පව්කළ තැනැත්තෝ මෙලොව පරලොව දෙකෙහිදීම දුකට පත්වෙති. එය බුදුදහම කියාදී ඇති සත්‍යයයි.